**හින්දු සංස්කෘතික අරමුදල - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හින්දු සංස්කෘතික අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය  සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල පනතේ, | | | |
| (i)6 වගන්තියේ 2 (I) උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද | ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග (දේශීය සහ විදේශීය) යන මාර්ගවලින් වර්ෂය තුළ අරමුදලට ලැබෙන අරමුදල් වර්ධනය කර ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයක් ලෙස සඳහන්ව තිබුණ ද, 2023 වර්ෂය තුළ ඒ සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | නව කාර්යාලයට පැමිණීමේ කටයුතු සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කළ නොහැකි වූ අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල් වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ii)6 වගන්තියේ 2 (I) හි (ඇ), (ඈ) සහ (ඉ) ඡේද | හින්දු ආගම සහ සංස්කෘතිය සඳහා වැදගත් වන දේශන, වැඩමුළු, පන්ති, විවාද, සංවාද සහ සංචාර මෙන්ම ආගමික හා සංස්කෘතික තරඟාවලි, ත්‍යාග ප්‍රදානය, සහතික පත්‍ර ප්‍රදානය යනාදී ක්‍රියාකාරකම් අරමුදල විසින් සිදු කළ යුතු වුවත් එබඳු කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි. | අදාළ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ ක්‍රියාකාරකම් සිදු කළ යුතු වේ. |
| (iii) 3 වගන්තියේ 11 ඡේදය | අරමුදලේ කටයුතු සම්බන්ධ ක්‍රියාපටිපාටි නියාමනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සිදු කළ යුතු වුවත් 2023 වර්ෂය සඳහා එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව අදාළ පරිදි නියාමන කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු වී නොතිබුණු අතර වර්ෂයක් සඳහා පැවැත්විය යුතු අවම රැස්වීම් ගණන ඇතුළත් කර පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | නියමිත පරිදි පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමෙන් අරමුදලේ කටයුතු නියාමනය කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,989,419 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,097,733ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,108,314ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය සඳහා ලබා දෙන ආධාර මුදල් වැඩි කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී හින්දු කෝවිල් හා ආයතන සඳහා මූල්‍යාධාර ලෙස වෙන්කළ රු.10,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.3,100,000ක් සහ නවරාත්‍රි උත්සවය සඳහා හින්දු අරිනරි පාසැල් වෙත මූල්‍යාධාර ලෙස වෙන් කළ රු.1,200,000 කින් රු.535,000 ක් එම වැඩසටහන් සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද, හින්දු ළමා නිවාස 50 ක් සඳහා රු.1,000,000 ක මූල්‍යාධාර ලබා දීමට ප්‍රතිපාදනය කළ මුදලින් එක් ළමා නිවාසයක පමණක් සංවර්ධන කටයුතු සඳහා රු.750,000 ක මුදලක් ලබා දී තිබූ අතර ඊට අදාළ ඇස්තමේන්තු, එළැඹි ගිවිසුම්වල පිටපත් ආදිය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | නව කාර්යාලයට පැමිණීමේ කටයුතු නිසා ඉටු කිරීමට නොහැකි වූ බව දන්වා ඇත.අදාළ ඇස්තමේන්තු, එළැඹි ගිවිසුම්වල පිටපත් ආදිය ලබා ගැනීම දිස්ත්‍රික් ලේකම්වරුන් සිදු කරන බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාළ ක්‍රියාකාරකම් සිදු කළ යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී රු.20,600,000 ක ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ හින්දු අධ්‍යාපනික සහ සංස්කෘතික වැඩසටහන් 11 ක් සහ රු.1,000,000 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ උඩරට කම්කරු ප්‍රජාව සඳහා වන ධාරිතා ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | නව කාර්යාලයට පැමිණීමේ කටයුතු සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කළ නොහැකි වූ අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාළ ක්‍රියාකාරකම් සිදු කළ යුතු වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)වාර්ෂික ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂය තුළ කිරිමුක්කන්ඩි කෝවිලෙන් අපේක්ෂිත රු.15,000,000 ක ආධාර මුදල් ලැබී තිබුණ ද, එයින් රු.8,000,000ක් නැවත එම කෝවිලේම අලංකරණය(Beautification) සඳහා ලබා දී තිබුණු අතර ඊට අදාළ ඇස්තමේන්තු, අනුමත සැලැස්ම ආදිය ලබා ගැනීමටත්, අදාළ කාර්යය නියමිත පරිදි සිදුවේ ද යන්න පිළිබඳ සමීප අධීක්ෂණයක් සිදු කිරීමටත් කටයුතු කර නොතිබුණි. | රු.15,000,000 ක ආධාර මුදලක් අදාළ කෝවිලෙන් ලැබී තිබුණු අතර රු.8,000,000 ක මුදලක් කෝවිලේ අලංකරණ කටයුතු සඳහා ලබා දී ඉතිරි මුදල් අරමුදලේ වෙනත් කාර්යයන් සඳහා යොදා ගෙන ඇති බව දන්වා තිබුණි. මූලාධාර ලබා දීම දිස්ත්‍රික් ලේකම් කාර්යලය හරහා සිදු කර තිබූ අතර අදාළ තොරතුරු ඒ සමඟ ඉදිරිපත් කර තිබූ බව දන්වා තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ ඇස්තමේන්තු හා තොරතුරු ලබා ගැනීමටත් ඒ සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ආ)කොඩි දින ආදායම රු.3,000,000 ක්, දේශීය හා විදේශීය වශයෙන් මූලාධාර රු.4,000,000 ක් සහ කලා කටයුතු ආශ්‍රිත වැඩසටහන් මඟින් රු.2,000,000 ක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත ආදායම් ලබා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම හේතුවෙන් එම ආදායම සම්පූර්ණයෙන්ම ද. අපේක්ෂිත පොත් අලෙවි ආදායම වූ රු.2,800,000 කින් රු.1,310,424 ක් හෙවත් සියයට 47ක් ද උපයා ගැනීමට නොහැකි වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් කොඩි දිනය හා කලා කටයුතු ආශ්‍රිත වැඩසටහන් මඟින් ආදායම ලබා ගැනීමට කටයුතු නොකෙරිණි. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා බව දන්වා තිබුණි. | අපේක්ෂිත පරිදි ආදායම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877 (1) (ඇ) ප්‍රකාරව අරමුදලක ඉදිරි වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ සහ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන, පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු වුවත් අයවැය ලේඛනය 2023 ජනවාරි 25 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී නියමිත කාලවකවානු තුළ ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ කාලසීමාවන් තුළ අයවැය ලේඛන අනුමත කර ගත යුතු වේ. |